### 1·4 සංඛ්‍යා සටහන

දේශීය ඉතුරුම්

| | 1974* | 1975* | 1976* | 1977* | 1978 |
|---|---|---|---|---|---|
| 1· වෙළඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 21,701 | 24,183 | 26,443 | 31,352 | 38,392 |
| 2· විදේශ සම්පත් (භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන - ශුද්ධ -) .. | 1,040 | 1,203 | 427 | - 852 | 1,867 |
| 3· ආයෝජන .. .. | 3,139 | 3,909 | 4,193 | 5,194 | 8,313 |
| 4 දේශීය ඉතුරුම් .. .. | 2,099 | 2,706 | 3,766 | 6,046 | 6,446 |
| 5· ඉතිරි කිරීම් අනුපාතය (4. එකෙහි ප්‍රතිශතයක් ලෙස) | 9·7 | 11·2 | 14·2 | 19 3 | 16·8 |

• තාවකාලිකයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

වෙළඳ මිළ අනුව වූ දළ දේශීය නිෂ්පාදිතය 1978 දී සියයට 22 කින් ඉහළ ගිය නමුත් එකී මිළ අනුව මනිනු ලැබූ දේශීය ඉතිරිකිරීම් වැඩිවූයේ සියයට 4 කින් පමණි. ආයෝජන රුපියල් දශලක්ෂ 2,961 කින් හෙවත් සියයට 57 කින් වැඩිවූ නමුදු ගෙවුම් ශේෂයෙහි ජංගම ගිණුමේ ක්‍රියාකාරිත්වය හේතු කොටගෙන භාණ්ඩ හා සේවා ආනයනයෙහි ශුද්ධ වෙනස රුපියල් දශලක්ෂ 2,719 ක් විය. මෙහි ප්‍රතිඵලය වශයෙන් දේශීය ඉතිරිකිරීම් වැඩිවූයේ රුපියල් දශලක්ෂ 244 කින් පමණි. එසේම 1978 දී ඉතිරිකිරීම් අනුපාතයද සියයට 19 සිට 16 දක්වා පහත වැටුණි.

## කෘෂිකර්මය

රබර් සහ පොල් නිෂ්පාදනයෙහි නැගීම, තේ නිෂ්පාදනයෙහි අඩුවීම, වීනිෂ්පාදනයෙහි තවදුරටත් ඇතිවූ වර්ධනය සහ අනෙක් වගාවන්හි නිෂ්පාදනය සාමාන්‍යයෙන් නොවෙනස්ව පැවතීම 1978 කෘෂිකර්ම අංශයෙහි කැපී පෙනෙන ලක්ෂණයන්ය. මාළු නිෂ්පාදනය වැඩි විය. එහෙත් මෙම වර්ධනය සත්ව පාලන කර්මාන්තයෙහි පහත බැසීම හේතුකොට ගෙන ඇති වූ සත්ව මාංශජනක ධාතු අවශ්‍යතාවයන්හි හිඟකම මකාලීමට තරම් ප්‍රමාණවත් නොවී ය. නොවැම්බර් මාසයේදී සුළි සුළඟක් මගින් නැගෙනහිර ප්‍රදේශයේ පොල්, වී, කජු සහ වන කර්මාන්තයට බෙහෙවින් හානි පමුණුවමින් එම ප්‍රදේශය විනාශයට පත්කරනු ලැබීය. සමස්ථයක් වශයෙන් ගත් කල 1978 වර්ෂය කෘෂිකර්ම අංශයට අසම ප්‍රතිඵල සහිත වර්ෂයක් විය.

වර්ෂය ආරම්භයේ දී කෘෂි අංශයේ සංවර්ධනය පිළිබඳව වගකිවයුතු අමාත්‍යාංශ 3 ක් විය. එනම්, කෘෂිර්ම සහ ඉඩම්, වැවිලි කර්මාන්ත සහ ධීවර යන අමාත්‍යාංශයන්ය. වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශයන් 6 ක් විය. කෘෂිකර්ම සංවර්ධන සහ පර්යේෂණ අමාත්‍යාංශය වී, අතිරේක ආහාර භෝග සුළු අපනයන භෝග වගාවන් සහ මෙම කටයුතු හා සම්බන්ධ පර්යේෂණ සහ ව්‍යාප්ති කටයුතු පිළිබඳ වගකිවයුතු අමාත්‍යාංශය බවට පත්කරන ලදී. කලින් පැවති කෘෂිකර්ම අමාත්‍යාංයේ ඉඩම් සංවර්ධනය සහ පවරා දීමේ කටයුතු අළුතින් ඇතිකරන ලද ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයටද, සත්ව පාලන සංවර්ධන කටයුතු තවත් අළුතින් ඇතිකරන ලද ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයටද පවරනලදී. රටෙහි ඉඩම් ප්‍රමාණයෙන් සියයට 40 ක පමණ ප්‍රමාණයක් අයත්වන මහවැලි ගංගා නිම්න සංවර්ධනය මහවැලි සංවර්ධන අමාත්‍යාංශය නම් නව අමාත්‍යාංශයට පැවරීමට තරම් වැදගත් ලෙස සලකනු ලැබීය. වැවිලි අංශය සම්බන්ධව ප්‍රධාන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අනුබද්ධව පොල් කර්මාන්ත අමාත්‍යාංශය යනුවෙන් නව අමාත්‍යාංශයක් පිහිටුවන ලදී.

පෞද්ගලික අයිතීන් යටතේ ඇති ඉඩම්වල කෘෂිකර්ම සංවර්ධන කටයුතු අධීක්ෂණය සහ සම්බන්ධීකරණය සඳහා කෘෂිකර්ම සංවර්ධන අධිකාරියක් පිහිටුවන ලදී. මෙම අධිකාරිය දේශපාලන නායකයන් සහභාගි කරවා ගැනීමේ පරමාර්ථය ඇතිව එහි කටයුතු ඡන්ද කොට්ඨාශ පදනමක් මත සංවිධානය කරනු ලැබීය. මෙතෙක් ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ පිළිවෙල මගින් මූල්‍ය ආධාර ලැබූ කෘෂිකර්ම විවිධාංගිකරණ වැඩ පිළිවෙල මගින් කරන ලද වගා විවිධාංගිකරණ කටයුතු (බෙහෙවින්ම මැදබිම්වල පිහිටි ආර්ථික නොවන තේ ඉඩම් වල) කිරීම සඳහා නව ජාතික කෘෂිකර්ම විවිධාංගිකරණ සහ ජනපද යෝජනා ක්‍රමය පිහිටුවන ලදී.

ඉඩම් ප්‍රතිසංස්කරණය යටතේ තමන්ගේ ඉඩම් අහිමි වූවනට සාධාරණත්වය ඉටුකිරීමේ අරමුණින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම කලින් ඉඩම් හිමියන් විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා විමර්ශනය කිරීම දිගටම කරගෙනයනු ලැබීය. මේ අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් රජයට අයත් විශාල ඉඩම් පරිපාලන ආයතන දෙක වන ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව අතර ඉඩම් වඩාත් ''විධිමත් ලෙස බෙදීමක්'' කරනු ලැබීය. මෙසේ කිරීමෙහි අරමුණ වූයේ මෙම ආයතනයන්හි ක්‍රියාකාරි වියදම් අඩු කිරීම සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීමය. තවද,ඉඩම්වල අවසාන අයිතිය අවිනිශ්චිත වූ අවස්ථාවන්හි දී අවශ්‍ය සංවර්ධන කටයුතු කල් දැමූ බවට සාක්ෂි ඇත. සමහරවිට මෙම වෙනස්කම් අවශ්‍ය ඒවා විය. එහෙත් එයින් එක්තරා ප්‍රමාණයකට අවුල්වීම් ඇති විය. මෙම ආයතන දෙකෙහි ප්‍රාදේශීය සංවිධානයන් පිළිබඳ අවසාන නිගමනයන් ගෙන තිබූ නමුත් වැවිලි කර්මාන්ත අංශයේ උසස් පරිපාලන මට්ටමේ නිලධාරීන්ගේ වේතන සහ දිරිගැන්වීම් දීමනා පිළිබඳ ප්‍රශ්න නො විසඳී එසේම පැවතුනි.

තේ මිලෙහි තියුණු පහත වැටීම තේ කර්මාන්තයේ ලාභ අඩු කිරීමට තුඩු දුන් අතර උස් බිම් සහ මැදි බිම් තේ මෙකී බලපෑමට වඩාත් ලක් වූ බව පෙනෙන්නට තිබුණි. තේ, රබර් සහ පොල් නැවත වගාකිරීම සඳහා දෙනු ලබන සහනාධාර ප්‍රමාණය වැඩිකර තිබියදීත්, නැවත වගාකිරීමේ ප්‍රගතිය බලාපොරොත්තු වූ ප්‍රමාණයන්ට වඩා පහත් මට්ටම්වල පැවතුනි. තේ කර්මාන්තයේ ලාභ අඩුවීම. තේ, රබර් සහ පොල් වගාව සඳහා අවශ්‍ය වගා ද්‍රව්‍යයන්ගේ හිඟකම, සහ නැවත වගාකිරීම සඳහා දෙනු ලබන සහනාධාර තවදුරටත් ප්‍රමාණවත් නොවීම (සහනාධාර ප්‍රමාණය බොහෝ අවස්ථාවන්හිදී පල නෙලාගන්නා කාලය තෙක් නිෂ්පාදකයාට නොලැබී යන ආදායමේ පාඩුව පියවීමට තරම් ප්‍රමාණවත් නොවීය) හේතුකොටගෙන නැවත වගාකිරීම අඩපන කරන බවක් පෙනුනි. සුළු අපනයන භෝග නැවත වගා කිරීම සහ අළුතින් වගා කිරීම දිරිගැන්වීම සඳහා වඩාත් සම්පූර්ණ සහනාධාර ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. වර්ෂය තුළදී පොහොර සහනාධාරයන් කීපවාරයක් සංශෝධනය කළ අතර අවසාන වශයෙන් 1978 නොවැම්බර් මාසයේදී ආනයනමිලෙන් සියයට 50 ක ඒකීය සහනාධාරයක් හඳුන්වා දෙන ලදී. ආනයන ලිහිල් කිරීමේ රජයේ ප්‍රතිපත්තිය දිගටම පවත්වාගෙන යමින් රාජ්‍ය පොහොර සංස්ථාවේ ආනයන ඒකාධිකාරය අහෝසි කරන ලදී.

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් තේ සහ රබර් කර්මාන්තයන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීමේ කටයුත්ත සමහර විදේශීය ආයතන කීපයකට භාරකොට තිබේ. කාලයක් තිස්සේ ලංකාව මෙම වගාවන් දෙක පිළිබඳව සැළකිය යුතු විශේෂඥතාවක් දියුණුකොට තිබීමත් මෙරට අතීතයේදී අනෙකුත් රටවල ආරම්භක කර්මාන්ත වලට උපකාර කොට තිබීමත් අනුව බලනකල මෙම වගාවන් දෙක සඳහා ඇත්තවශයෙන්ම මෙවැනි විදේශ ආධාර අවශ්‍ය ද යන්න විවාදත්මක කරුණක්ව පවතී. වර්ෂය අවසානයේ දී මෙම ප්‍රධාන සැලසුම් ලැබෙතැයි බලාපොරොත්තු විය. දික්ඔය සහ මස්කෙළිය ප්‍රදේශයේ තේ වතු පුනරුත්ථාපනය කිරීම සඳහා පස් අවුරුදු යෝජනා ක්‍රමයක් 1978 මැද භාගයේ දී ප්‍රකාශයට පත්කරණ ලදී. මෙම යෝජනා ක්‍රමය නිෂ්පාදන වියදම් අඩු කිරීම සහ තේ වල තත්ත්වය වැඩි දියුණු කිරීමත් අරමුණු කර ගත්තකි. 1978 අවසාන කාලයේ දී පමණ ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු හිමියන් විසින් නිපදවන තේ දළු සඳහා අවම සහතික මිලක් ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

1978 අවසාන කාලයේදී, අළුතින් පිහිටුවන ලද ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් සත්ව ආහාර මිල අඩු කිරීමක් සිදුකරන ලදී. සත්ව ආහාරවල ඉහළ මිල සහ මස් සහ කිරි වැනි සමහර භාණ්ඩයන්ගේ පාලිත මිල ගණන් සත්ව පාලන කර්මාන්තයේ දියුණුවට බාධාකාරිව පැවැති බව ඉතාමත් පැහැදිලි කරුණක් විය. ඒ අතරම මෑත වර්ෂ වල දී අවාසිදායකව පැවති නිෂ්පාදන ලාභ වැඩි කිරීමේ අරමුණින් ජාතික කිරි මණ්ඩලය විසින් කිරි ගැනුම් මිල ගණන් ඉහළ නංවන ලදී.

1977/78 මහ කන්නයේ දී කොන්දේසි ලිහිල් කොට දෙන ලද කෘෂි කාර්මික ණය අනිසි අන්දමින් පාවිච්චි කිරීම පුළුල් වශයෙන් දක්නට ලැබුණි. මෙම ණය ආපසු අයකර ගැනීම් ඉතාම පහත් මට්ටමක පැවතිණි. ණය ප්‍රමාණය පස් ගුණයකින් වැඩිවීමේ උද්ධමනකාරී බලපෑම සැලකිය යුතු වන්නට ඇත. මෙම හේතූන් නිසා සපිරි ග්‍රාමීය ණය ක්‍රමය යටතේ 1978 යල් කන්නය සඳහා ණය දීම සැලකිය යුතු පරිදි සීමා කරනු ලැබීය. ඉකුත් මහකන්නයේ ණය ආපසු ගෙවන ලද ගොවීන් පමණක් අනාගතයේ දී ණය ගැනීමට සුදුස්සන් වශයෙන් සලකන ලදී. ණය අධීක්ෂණය සහ ණය ආපසු ලබාගැනීම සඳහා ඵලදායී වැඩ පිළිවෙලක් වාණිජ බැංකු විසින් ඇතිකෙරේ යැයි බලාපොරොත්තුවෙන් රජය වෙනුවෙන් මහ බැංකුව විසින් දෙනු ලැබූ සියයට 75 ක ණය ඇපය ඉවත් කරන ලදී.

1978 දී වාර්තාගත මහ සහ යල වී අස්වැන්නෙන් සියයට 35 ක් මිලදී ගැනීමට වී අලෙවි මණ්ඩලය සමත් විය. එහෙත් වී මිල දී ගැනීම් හි ඉහළ යාමට ප්‍රමාණවත් පරිදි මණ්ඩලය විසින් ස්වකීය ගබඩා ධාරිතාව ඉහළ නො නැංවීම නිසා සැලකිය යුතු වී තොගයක් එලිමහනේ ටාර්පෝලින් ආවරණ යටතේ ගබඩාකර තැබීමට සිදුවිය. ආරම්භයේදී වී කෙටීමේ අපහසුකම් හේතු කොට ගෙන ආහාර කොමසාරිස් වරයාගේ සහල් අවශ්‍යතා සම්පූර්ණයෙන් සැපයීමට මණ්ඩලයට නො හැකි විය. පසුව ඉහල තොග මට්ටම් හේතු කොට ගෙන ආහාර කොමසාරිස්වරයාට මණ්ඩලයෙන් වී මිල දී ගැනීම අඩුකිරීමට සිදු විය. මෙම මණ්ඩලයේ ගබඩා පහසුකම් පිළිබඳ ප්‍රශ්නය තියුණු කරනු ලැබීය. මැයි මාසයේ අග සිට සලාකය සඳහා වී ද නිකුත් කිරීමට තීරණය කරණ ලදී. වී නිකුත් කිරීම බෙහෙවින් ජනප්‍රිය වූ අතර එයින් මංඩලයේ ගබඩා සහ වී කෙටීම් පිළිබඳ ප්‍රශ්න තරමක් දුරට ලිහිල් විය. ජනගහනයෙන් අඩකගේ පමණ සහල් සහනාධාරය සහ සලාක නිකුත් කිරීම් ඉවත් කිරීම වී සහ සහල් පිළිබඳව ක්‍රියාකාරී පෞද්ගලික වෙළඳ පොළක වර්ධනයට ඉවහල් විය. ආනයන ලිහිල් කිරීම හේතුකොට ගෙන යල් පැන ගිය සහල් කෙටීමේ කර්මාන්තය වසර තුළදී දියුණු වූ අතර ඉන් සහල් පිළිබඳ පෞද්ගලික වෙළඳ පොලේ හදිසි ප්‍රසාරණයට මුහුණ දීමට හැකිවිය.

1977 දී පොරොන්දු වූ .කෘෂිකාර්මික ව්‍යුහයේ ප්‍රතිසංස්කරණ 1978 දී ද ඉටු නොවිය. කෘෂිසේවා මධ්‍යස්ථාන දිගටම නිලධාරි පරිපාලනය යටතේ පැවතුණි. වී වගාව පිළිබඳ පුරාණ ඓතිහාසික උත්සවවලට නව පණක් දීමට උත්සාහයක් දැරිණි කුඩා වාරිමාර්ග ජලාශ පවත්වාගෙන යාම ඇතුළත්ව, සම්පූර්ණ කෘෂිකාර්මික ව්‍යුහය, අධීක්ෂණය කිරීම සඳහා කලින් පැවති ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ප්‍රතිසංවිධානය කිරීමට ඇති ඉඩකඩ ගැන දැන් සළකා බලාගෙන යනු ලැබේ.

රජයේ කෘෂිකාර්මික මිල ප්‍රතිපත්තියේ වැදගත් වෙනස්කම් කිහිපයක් 1978 වර්ෂය. තුළදී සිදු කරනු ලැබීය. සලාක කරන ලද ආහාර ද්‍රව්‍ය සම්බන්ධව සලකා බැලීමේ දී, ආහාර කොමසාරිස් වරයා විසින් සමුපකාර සමිති මගින් නිදහස් වෙළඳ පලට රාත්තලක් රු. 1.45 බැගින් සහල් සපයනු ලැබීය. මෙය ගොවියාට බුසලකට රු. 40 බැගින් ගෙවීමට සහ වී කෙටීම හා බෙදු හැරීමට යන වියදම් ආදියට දළවශයෙන් සැසඳෙන මිලකි. මෙම සහල් සඳහා පාරිභෝගික කැමැත්ත අඩු වුව ද ඒවා අලෙවිය සඳහා පැවතීම නිදහස් වෙළඳ පලේ සහල් මිල ස්ථාවර කිරීමට උපකාරි විය. පිටි මිල අවස්ථා තුනකින් රාත්තල ශත 60 සිට රු. 1.12 දක්වා වැඩි කරණ ලදී. මෙම මිල, තවමත් ලෝක වෙළඳ පල මිලගණන් වලට වඩා අඩු එකකි. මෙම සහනදායි මිලට ඇති තරම් පිටි ලබාගත හැකි වීම අතිරේක ආහාර භෝග

වගාවන්ගේ වර්ධනය සමහර විට අධෛර්යමත් කරන්නට ඇත. සීනි මිල ලෝක වෙළඳ පොළේ මිලට වඩා වැඩි මට්ටමක් වූ රාත්තල රුපියල් 3 හි නො වෙනස්ව පැවතින. කෙසේ වුව ද මෙය උක් සහ හකුරු කර්මාන්තය කෙරේ අහිතකර බලපෑම් ඇති කළ බැව් පෙනේ. නිෂ්පාදනයේ පැහැදිලි කාලීන වෙනස්කම් පවතින සමහර කෘෂි නිෂ්පාදිතයන්ගේ මිල ගණන් ස්ථාවර කිරීමේ අරමුණ ඇතිව රජය විසින් ආරක්ෂිත තොගයන්ද රැස්කර තබන ලදී. එවැනි ආරක්ෂිත තොගයන් දේශීය නිශ්පාදනයෙන් රැස්කරනු ලබන තරමට නිෂ්පාදකයින්ට මෙන්ම පාරිභෝගිකයින්ට ද කාලීන මිල උච්චාවචනයන්ගේ බලපෑම අඩුවීමේ වාසි භුක්ති විඳිය හැකිය. එහෙත් දේශීය සැපයුම ප්‍රතිපූරණය කිරීම සඳහා ආනයන 'කරනු ලබන විට මිල ගණන් පහත් මට්ටමක ස්ථාවර වීමට නැඹුරුවීමෙන් දේශීය නිෂ්පාදනය කෙරේ අහිතකර බලපෑම් ඇතිවිය හැකිය. එනු, මිරිස්, අර්තාපල්, මාළු සහ කුකුල් මස් එසේ මිල ගණන් ස්ථාවර කිරීම සඳහා ආනයනය කරන ලද ද්‍රව්‍යයන් අතර විය. පරිප්පු සහ මුංඇට ද තරමක් දුරට ආනයනය කරන ලදී. එනු, අර්තාපල් මුං ඇට සහ කව්පි වල දේශීය නිෂ්පාදනය පහත වැටීමට අඩුවශයෙන් තරමක් දුරටවත් මෙම ආනයන ප්‍රතිපත්තිය හේතුවන්නට ඇත. මෙම ආනයනයන් වෙළඳ පලට මුදාහැරීමේදී රජය විසින් දේශීය නිෂ්පාදකයනට සැලකිය යුතු ලාභ ආන්තිකයක් ලබා ගැනීමට ඉඩ හල බව සඳහන් කිරීම වැදගත් ය. එනිසා මෙම ප්‍රතිපත්තියෙන් අධෛර්යමත් වන්නට ඇත්තේ අධික ලාභ ආන්තිකයකට පුරුදුව සිටි නිෂ්පාදකයින් පමණක් විය හැකිය. එමෙන්ම සමහර නිෂ්පාදකයින් 1978 වී සඳහා පැවති බෙහෙවින් හිතකර තත්ත්වයන් යටතේ ලද හැකි වඩා වාසිදායක ඉපයීම් නිසා ආපසු වී වගාවට මාරු වූවා විය හැක. පොල් කර්මාන්තය සඳහා 1978 දී සංකීර්ණ අපනයන බදු ක්‍රමයක් සහ ලාභ පාලනය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබීය. මෙම පාලනයේ අරමුණ වූයේ පාරිභෝගිකයන් ගෙවන මිල සාධාරණ මට්ටමක පවත්වා ගැනීමත්, ගෙඩියකට නිෂ්පාදකයාට ශත 65 ක (පසුව මෙය ශත 85 දක්වා වැඩි කරන ලදී.) මිලක් සහතික කිරීමත් ය.

මූලික වශයෙන් කෘෂිකාර්මික අංශය සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ප්‍රතිපත්තීන් රජයේ ප්‍රතිපත්ති වලින් අපේක්ෂිත අරමුණුවල ප්‍රතිවිරුද්ධතාවයක් පිළිබිඹු කෙරිණ. වතු වගා අංශයෙහි මෙම ගැටුම රජයේ ආදායම් අවශ්‍යතාව සහ ගොවියාගේ ආර්ථික ශක්තිය සහතික කිරීම අතර වීය. දේශීය අංශයෙහි මෙම ගැටුම වූයේ පාරිභෝගිකයාට සාධාරණ මිල ගණන් සහතික කිරීමේ අවශ්‍යතාව සහ ගොවියාට ලාභදායී වන මිල ගණන් සහතික කිරීම අතරය. එවැනි ගැටුම් පහසු විසඳුම් සඳහා ඉඩ නො සලසයි. එහෙත් මෙම වැදගත් අංශයේ පුනර්ජීවනය උදෙසා කඨිනම් විසඳුම් අවශ්‍ය වේ.

පසුගිය දශකය තුල දී ප්‍රධාන භෝග සතරෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ මූලික දර්ශකයන් 1·5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

තේ


ඉකුත් වර්ෂයේ පැවැති පහත් නිෂ්පාදන මට්ටමින් මිදීමේ සලකුණු 1977 දී පෙන්නුම් කළ තේ කර්මාන්තය 1978 වර්ෂයේ දී එම අපේක්ෂාවන් සපුරාලීමට අපොහොසත් විය. 1977 දී රාත්තල් දශලක්ෂ 460 ක්වූ තේ නිෂ්පාදනය 1978 දී රාත්තල් දශලක්ෂ 439 දක්වා සියයට 5කින් අඩුවිය. මෙය ඉකුත් දශකයේ අඩුම නිෂ්පාදනය වූ 1976 වර්ෂයේ නිෂ්පාදන මට්ටමට වඩා ඉතා සුළු වැඩිවීමක් පෙන්නුම් කරන අතර 1965 රාත්තල් දශලක්ෂ 503 ක් වූ වාර්තාගත නිෂ්පාදනයට වඩා බෙහෙවින් අඩුය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කර්මාන්තයෙහි මෙම පහත වැටීමට මුළුමනින්ම හේතුවූයේ උස් සහ මැදි බිම් තේ නිෂ්පාදනය තියුණු ලෙස අඩුවීමත් පහත් බිම් තේ නිෂ්පාදනයේ වර්ධනය හීන වීමත්ය. ඊට පෙර වර්ෂයේ රාත්තල් දශලක්ෂ 16 ක හෝ සියයට 13 ක වැඩිවීම හා සැසඳීමේදී පහත් බිම් තේ නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ 7 කින් හෙවත් සියයට 5 කින් වැඩිවිය. ඉකුත් වර්ෂයේ රාත්තල් දශලක්ෂ 6 ක් හෙවත් සියයට 4 කින් වූ නිෂ්පාදනයේ ඉහල යාමට හාත්පසින්ම වෙනස්ව උස්බිම් තේ නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ 15 කින් හෙවත් සියයට 9 කින් පහත වැටුනි. මැදිබිම් තේ නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ 13 කින් හෙවත් සියයට 8 කින් අඩු විය. ඉකුත් වර්ෂයේදී මැදි බිම් තේ නිෂ්පාදනය සියයට 3 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. තේ වැවිලි අංශය සඳහා වාර්තාගතව ඇති පොහොර නිකුත් කිරීම 1977 දී වූ මෙට්‍රික් ටොන් 80,394 සිට 1978 දී මෙට්‍රික් ටොන් 1,15,500 දක්වා නැතහොත් සියයට 44 කින් තියුණු ලෙස ඉහල නැංගේය. මෙය පසුගිය වසරේ දක්නට ලැබුණු පොහොර නිකුත් කිරීම්වල සියයට 18 ක පහත වැටීමට ප්‍රතිවිරුද්ධ තත්ත්වයකි. කෙසේවුවද 1977 වර්ෂයේ සියයට 7 ක වැඩිවීම හා සසඳන කළ 1978 දී අක්කරයක සාමාන්‍ය ඵලදාව සියයට 7 කින් පහත වැටිණි.

පුස්තකාලය,
ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය,
කටුබැද්ද මණ්ඩපය,
මොරටුව.

## ප්‍රධාන නිර්යාත භෝග නිෂ්පාදනය

වාර්ෂිකව





ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

30937

# වී නිෂ්පාදනය සහ සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම්

වාර්ෂිකව




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

**1·5 වැනි සංඛ්‍යා සටහන** **ප්‍රධාන කෘෂිකාර්මික භෝග පිළිබඳ දර්ශක 1969 – 1978**

| භෝගය | 1969 | 1970 | 1971 | 1972 | 1973 | 1974 | 1975 | 1976 | 1977 | 1978 (තාවකාලික) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1· තේ** | | | | | | | | | | |
| 1·1 නිෂ්පාදනය (රාත්තල් දශලක්ෂ) .. | 484 | 468 | 480 | 471 | 466 | 450 | 471 | 433 | 460 | 439 |
| 1·2 වගාකළ බිම් ප්‍රමාණය (අක්කර) .. | 556,514 | 597,499 | 597,171 | 597,645 | 598,740 | 598,466 | 597,691 | 594,481 | 598,024 | 603,464 |
| 1·3 අක්කරයක ඵලදාව (රාත්තල්) .. | 811 | 811 | 833 | 816 | 805 | 882 | 920 | 839 | 899 | 838 |
| 1·4 නිෂ්පාදන පිරිවැය (රා./රුපියල්) .. | 1·51 | 1·52 | 1·54 | 1·60 | 2·03 | 2·52 | 3·04 | 3·37 | 3·54 | 4·76 |
| 1·5 සාමාන්‍ය මිල (රා/ රුපියල්) | | | | | | | | | | |
| – කොළඹ ශුද්ධ .. | 1·53 | 1·63 | 1·81 | 1·90 | 1·92 | 2·67 | 2·79 | 3·54 | 6·10 | 5·28 |
| – අපනයන නැ·වි·ස· . | 2·39 | 2·44 | 2·50 | 2·77 | 2·78 | 3·52 | 4·12 | 4·76 | 8·55 | 15·07 |
| 1·6 වාර්ෂික නැවත වගා කළ අක්කර .. | 6,500 | 6,857 | 6,640 | 6,418 | 5,953 | 4,282 | 4,356 | 2,756 | 3,067 | 5,811 |
| 1·7 සමුච්චිත නැවත වගා කළ අක්කර .. | 33,428 | 40,285 | 46,925 | 53,343 | 59,296 | 63,578 | 67,934 | 70,690 | 73,757 | 79,568 |
| **2· රබර්** | | | | | | | | | | |
| 2·1 නිෂ්පාදනය (රාත්තල් දශලක්ෂ) .. | 333 | 351 | 312 | 309 | 341 | 291 | 328 | 335 | 322 | 343 |
| 2·2 වගා කළ බිම් ප්‍රමාණය (අක්කර) .. | 563,633 | 568,900 | 567,994 | 567,060 | 565,000 | 563,406 | 562,494 | 560,872 | 559,850 | 559,257 |
| 2·3 කිරි කපන ලද බිම් ප්‍රමාණය අක්කර .. | 493,712 | 496,210 | 494,355 | 491,324 | 475,529 | 475,165 | 477,110 | 474,626 | 466,401 | 456,434 |
| 2·4 අක්කරයක ඵලදාව (රාත්තල්) .. | 674 | 707 | 657 | 658 | 694 | 634 | 691 | 705 | 690 | 753 |
| 2·5 නිෂ්පාදන පිරිවැය (රා /රුපියල්) .. | 0.71 | 0·69 | 0·76 | 0·75 | 0·85 | 1·12 | 1·25 | 1·49 | 1·70 | 2·20 |
| 2·6 සාමාන්‍ය මිල (රා /රුපියල්) .. | | | | | | | | | | |
| – කොළඹ ආර්·එස්·එස්. නො. 1 .. | 1·04 | 0·91 | 0·79 | 0·81 | 1·17 | 1·28 | 1·13 | 1·97 | 2·05 | 3·14 |
| – අපනයන නැ·වි·ස· .. | 1·37 | 1·24 | 1·08 | 0·93 | 1·67 | 2·61 | 1·84 | 2·95 | 3·11 | 6·76 |
| 2·7 වාර්ෂික නැවත වගා කළ අක්කර . | 12,084 | 10,239 | 8,477 | 8,742 | 7,276 | 7,076 | 7,980 | 6,299 | 6,454 | 7,968 |
| 2·8 සමුච්චිත නැවත වගා කළ අක්කර .. | 276,132 | 286,371 | 294,848 | 303,590 | 310,866 | 317,942 | 325,922 | 332,221 | 338,685 | 346,653 |
| **3· පොල්** | | | | | | | | | | |
| 3·1 නිෂ්පාදනය (ගෙඩි දශලක්ෂ) .. | 2,440 | 2,510 | 2,610 | 2,963 | 1,935 | 2,031 | 2,398 | 2,330 | 1,821 | 2,207 |
| 3·2 නිෂ්පාදන පිරිවැය (ගෙඩියකට රුපියල්) | 0·07 | 0·08 | 0·08 | 0·08 | 0·10 | 0·10 | 0·11 | 0·16 | 0·21 | 0·25 |
| 3·3 සාමාන්‍ය මිල (ගෙඩියකට/රුපියල්) .. | | | | | | | | | | |
| – කොළඹ .. | ලැ·නො· | ලැ·නො· | ලැ·නො· | 0·14 | 0·25 | 0·56 | 0·32 | 0·45 | 0·92 | 0·85 |
| – අපනයන නැ·වි·ස· .. | 0·25 | 0·27 | 0·27 | 0·21 | 0·34 | 0·86 | 0 46 | 0·47 | 1·19 | 1·85 |
| **4· වී** | | | | | | | | | | |
| 4·1 නිෂ්පාදනය (බුසල් දශලක්ෂ) .. | 65·8 | 77·5 | 66·9 | 62·9 | 62·9 | 76·8 | 55·3 | 60·0 | 80·4 | 90·6 |
| 4·2 අක්කර ප්‍රමාණය වපුළ ('000) .. | 1,709 | 1,876 | 1,794 | 1,795 | 1,792 | 2,038 | 1,719 | 1,789 | 2,046 | 2,162 |
| – අස්වැන්න නෙලාගත් ('000) | 1,539 | 1,776 | 1,714 | 1,579 | 1,660 | 1,969 | 1,476 | 1,570 | 1,933 | 2,074 |
| – වැඩිදියුණු කළ වී වගී යටතේ('000) | 1,108 | 1,325 | 1,204 | 1,252 | 1,284 | 1,647 | 1,285 | 1,381 | 1,710 | 1,692* |
| 4·3 අක්කරයක ඵලදාව (බුසල්) .. | 50·33 | 51·30 | 45·91 | 46·87 | 44·58 | 45·65 | 44·04 | 44·91 | 48·92 | 50·70 |
| 4·4 සහතික මිල (බුසලකට/රුපියල්) .. | 14·00 | 14·00 | 14·00 | 14·00 | 18·00 | 33·00 | 33·00 | 33·00 | 33·00 | 40·00 |
| 4·5 සහතික මිල ක්‍රමය යටතේ මිලදී ගැනීම (බුසල් දශලක්ෂ) .. | 13·7 | 26·2 | 32·4 | 26·4 | 22·9 | 20·9 | 11·3 | 12·8 | 24·6 | 32·0 |

• අපනයනයන්ට අදල ගෙඩියක සාමාන්‍ය මිළ

* 1978 යල කන්නය සඳහා යාපනය, රත්නපුරය හා මඩකලපුව යන දිස්ත්‍රික්ක වල සංඛ්‍යා ඇතුළත් නොවේ.

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
රබර් පාලන දෙපාර්තමේන්තුව,
පොල් අලෙවි මණ්ඩලය,
පොල් සංවර්ධන අධිකාරිය,
පොල් වගා මණ්ඩලය,
ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්
කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අ
වී අලෙවි මණ්ඩලය.

තේ වගාව යටතේ ඇති මුළු අක්කර ප්‍රමාණය 1978 දී අක්කර 6,03,464 දක්වා සියයට 1 කින් වැඩිවිය. වර්ෂය තුළදී නැවත වගාකරන ලද අක්කර 5,811 ක බිම් ප්‍රමාණය 1977 දී නැවත වගා කරන ලද බිම් ප්‍රමාණය වන අක්කර 3,067 ට වඩා සෑහෙන දියුණුවක් පෙන්වයි. එහෙත් මෙය නැවත වගා කිරීමේ අපේක්ෂිත ඉලක්කය වන අක්කර 7,500 ට වඩා බෙහෙවින් අඩුය. 1978 අවසානය වන විට වැඩි අස්වැන්නක් ලබා දෙන තේ නැවත වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය අක්කර 79,568 ක් විය, මෙය රටෙහි මුළු තේ බිම් ප්‍රමාණයෙන් සියයට 13 ක පමණ සුළු ප්‍රමාණයකි.

1978 වර්ෂයේ තේ කර්මාන්තයේ අයහපත් ක්‍රියාකාරිත්වය අගැයීමේදී කාලගුනික තත්ත්වය වඩා යහපත්ව පැවැති කාලයක නිෂ්පාදකයින් අධික නිෂ්පාදනයක් සඳහා පොළඹවන අයුරින් 1977 දී තේ මිළ ගණන් අනපේක්ෂිත මට්ටමකට ඉහල නැගීමේ වැදගත් කරුණු සැලකිල්ලට ගතයුතුය. කෙසේවුවද 1978 දී මිළ ගණන් සැලකිය යුතු අන්දමින් පහළ වැටුනි. සාමාන්‍ය වශයෙන් ගත් කළ 1978 දී ශ්‍රී ලංකාවේ තේ වල ලංඩන් වෙළඳපල මිළ ගණන් 1977 වර්ෂයට වඩා සියයට 44 කින් අඩුය. එම මිළ ගණන් 1977 මුල් කාලයේ පැවති උපරිම මිළ ගණන් වලින් හරි අඩක් පමණ විය. කොළඹ වෙළඳපල මිළ ගණන්ද සාමාන්‍යයෙන් 1977ට වඩා සියයට 13 කින් පමණ අඩුවිය. එමෙන්ම 1977 නොවැම්බර් මාසයේදී ක්‍රියාත්මක කළ තේ කර්මාන්තයෙන් බදු අය කිරීමේ පදනම වෙනස් කිරීමද, පහල වැටෙමින් පැවැති මිළ ගණන් මධ්‍යයේ මෙම කර්මාන්තය කෙරෙහි අවාසිදායක බලපෑමක් ඇති කෙරිණි. මෙම වෙනසට පෙර බදු අය කිරීම පදනම් වූයේ නාමික අපනයන තීරු ගාස්තුවක් සහ වෙන්දේසි මිළ ගණන් අනුව තීරණය කළ වටිනාකම් මත පදනම් වූ බද්දක් මතය. මෙය සැලකිය යුතු විශේෂිත අපනයන තීරු ගාස්තුවක් වශයෙන් සහ වෙන්දේසි මට්ටමේ සාපේක්ෂ වශයෙන් අඩු වටිනාකමක් මත පදනම් වූ බද්දක් වශයෙන් වෙනස් කරන ලදි. නිසැකවම මෙය 1977 දී කළ විනිමය ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් වශයෙන් තේ කර්මාන්තයට එකතු වන අනපේක්ෂිත ලැබීම ඉවත් කිරීමේ වඩා පහසු මාර්ගයක් විය. එහෙත් මිළ ගණන් වල පහත වැටීමත් සමග විශේෂිත බදු බර වඩා වැඩි වූ අතර විශේෂිත අපනයන තීරුගාස්තුවේ කිසිම වෙනසක් නොකෙරිණි. අනෙක් අතට, 1978 දී නිෂ්පාදන වියදම (තේ නැවත වගා කිරීමේදී අවශ්‍ය වන අතිරේක ශ්‍රමය සඳහා වන වියදම ගණන් නොගෙන) සියයට 30 කින් පමණ ඉහල ගොස් ඇතැයි ඇස්තමේන්තු කොට ඇත. මෙසේ පහත වැටෙන ආදයම සහ ඉහළ යන වියදම තේ කර්මාන්තය බෙහෙවින් පීඩාකාරී ග්‍රහනයකට හසු කළ අතර 1978 නිෂ්පාදක ලාභද ඉතා තියුණු ලෙස අඩු කරනු ලැබිය.

මෙය, මැද පෙරදිග ස්ථාවර වෙළඳපල තත්ත්වයන් නිසා වාසිදායක මිළ ගණන් නොකඩවා ලැබූ පහත් බිම් තේ නිෂ්පාදනයේ 1978 දී ඇති වූ වැඩිවීමක් සාපේක්ෂ වශයෙන් ගත් කළ අවාසිදායක මිළ ගණන් ලැබූ උස් සහ මැදි බිම් තේ නිෂ්පාදනයන්හි දැඩි පහත වැටීමත් මගින් සනාථවේ. ලාභ පිරිහීමට මුහුණ පෑ නිෂ්පාදකයා නිතරම වියදම් අඩුකිරීම උදෙසා අනුමත කරන ලද වගා පිළිවෙත් නොසලකා හැරීමට පෙළඹී තිබේ. මෙය අනාගත නිෂ්පාදනයේ පිරිහීමකට තුඩුදුනි. 1972 සහ 1975 ඉඩම් ප්‍රතිසංස්කරණයන්හි සිට රජය වෙත පැවරුණු තේ ඉඩම් වලින් වැඩි කොටසක් පාලනය කරනු ලැබූ රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන විශාල රාජ්‍ය ඉඩම් පරිපාලන ආයතන දෙක 1978 දී ඔවුන්ගේ 1977 නිෂ්පාදන මට්ටම් පවත්වා ගැනීමට සමත් වී තිබෙන බව පෙනෙන්නට තිබේ. තේ නිෂ්පාදනයෙහි පහත වැටීම ප්‍රධාන වශයෙන්ම පෞද්ගලික ඉඩම්වල සිදුවූවක් බව මින් අදහස් වේ.

කෙසේවුවද, රටෙහි වඩා සශ්‍රීක තේ වතු පාලනය කරනු ලැබූ මෙම සංස්ථාවන් දෙක ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ අපේක්ෂිත වැඩිවීමෙන් විශාල කොටසකට වගකිවයුතු තත්ත්වයක පසුවිය යුතු බව සඳහන් කළ යුතුය. ඒ අනුව බලන කළ 1978 දී මෙම ආයතන දෙකේ ක්‍රියාකාරිත්වය බලාපොරොත්තු කඩවන සුළු තත්වයක පැවති බව සැලකිය හැකිය. කෙසේවෙතත් මෙම අයහපත් තත්ත්වයට බලපෑ බාහිර කරුණු ද පැවතිනි. කලින් ජනාවාස කොමිසම සතුව පැවති ඉඩම් මෙම ආයතන වෙත පැවරීමත් 1978 දී මෙම ප්‍රධාන ආයතන දෙක අතර ඉඩම් බෙදහැරීම විධිමත් කිරීමත් නිසා යම් බාධා ඇති විය. එහෙත් මෙම ආයතනික වෙනස්කම් ඉදිරි වර්ෂයන්හිදී නිෂ්පාදනය කෙරෙහි හිතකර බලපෑම් ඇති කිරීමට පුළුවන. එසේම පොහොර

සහනාධාර සම්බන්ධව රජය විසින් රාජ්‍ය ආයතනයන් සඳහා විශේෂිත ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ලැබීය. මෙම ප්‍රතිපත්තිය යටතේ 1978 වර්ෂයේ වැඩි කොටසක් තුළදී මෙම ආයතනයන්ට ලැබුනේ පෞද්ගලික ඉඩම් හිමියන්ට දෙනු ලැබූ සහනාධාරයෙන් අඩක් පමණි. රජයේ ආයතන-යන් නිසා ඒවායේ කටයුතු වලදී මූල්‍ය ස්ථාවරත්වය එතරම් වැදගත් නොවන බව රජය සැලකූ බවක් පෙනෙන්නට ඇත. එහෙත් එවැනි තීරණයන් මෙම ආයතනයන් මත සැලකිය යුතු ද්‍රවශීලතා සීමා කිරීම් පැනවූ බව වැදගත් කරුණකි. එමෙන්ම ලාභවල පිරිහීම වතු පරි පාලකයන්ගේ සානුබලයන් කෙරෙහි බලපාන්නට ඇත.

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු වතු කම්කරුවන් එතෙර යැවීමේ සමුච්චිත ප්‍රතිඵල හේතුකොට ගෙන සමහර උස් බිම් ප්‍රදේශවල දැඩි ශ්‍රම හිඟයක් පැවතිනි. මෙම ශ්‍රම හිඟය නිසා නිෂ්පාදනය පහත වැටීමට හේතුවන පරිදි තේ දළු නෙලීමේ වාර ගණන් සීමා කිරීමට වැවිලිකරුවනට සිදුවූ බව වාර්තා වී ඇත. සමහර උස්බිම් ප්‍රදේශවල කාලගුණික තත්ත්වයන්ද අයහපත්ව පැවති බවට වාර්තා වී ඇත.

තේ නැවත වගාකිරීම තවදුරටත් පහත් මට්ටමක පැවතීමට බලපෑ හේතු වශයෙන් ලාභ අඩුවීම, රාජ්‍ය ආයතනයන්හි ද්‍රවශීලතාවය සම්බන්ධව වූ සීමාවන්, ආයතනික ප්‍රතිසංස්කරණයන් නිසා සිදුවූ බාධාකිරීම සහ සමාලෝචනය කෙරෙන වර්ෂය තුළදී පැල සැපයීම ප්‍රමාණවත් නොවීම යන කරුණු දැක්විය හැකිය.

සමස්ථ වශයෙන් ගෙන බලන කල තේ කර්මාන්තයට ප්‍රධාන ගැටලු කිහිපයකට මුහුණ පෑමට සිදුව ඇති බැව් පෙනී යයි. පසුගිය වාර්ෂික වාර්තාවේ අවධාරණය කරන ලද පරිදි ආර්ථිකයේ මෙම වැදගත් අංශයේ ඉහළ ඵලදායිතාවක් සඳහා නැවත වගා කිරීම දැනට වඩා ඉහල මට්ටමකට නැංවීමත් රාජ්‍ය අංශයේ වඩා කාර්යක්ෂම පරිපාලනයත් අනුමත කරන ලද වගාක්‍රම පවත්වාගන යාමට ඉඩ ලබා දෙන අන්දමේ ලාභ ලැබීමත් අවශ්‍යවේ. තේ නැවත වගා කිරීම සඳහා අවශ්‍ය මුදල් අපනයන මත පැනවූ බද්දකින් සපයාගනු ලබන අතර සහනාධාර වැඩි කිරීමකින් නැවත වගා කිරීම ඉහල මට්ටමක පවත්වාගෙන යාමට බෙහෙවින් ඉඩකඩ ඇත වැඩිවන පැල අවශ්‍යතාවන් සපුරාලීමට නම් වැඩියෙන් පැල තවාන් ඇතිකළ යුතුව ඇත. රජය සතු ඉඩම්වලින් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට නම් වතුපාලකයින්ට කාර්යක්ෂම සානුබල ක්‍රමයක් ඇතිකිරීම අවශ්‍යය. දැනට පවත්නා ඒකීය පාරිතෝෂිකයන් සහ ප්‍රමිතිකරණයට භාජන වූ වැටුප් ක්‍රමය යටතේ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා දිරි-ගැන්වීමක් ඇති නොවේ. එමෙන්ම වතුපාලකයින් සතුව පැවති තීරණයන් ගැනීමේ බලය රාජ්‍ය අයිතිය යටතේ සැලකිය යුතු පරිදි අඩුකර ඇති බැව් පෙනී යයි. පරිපාලනය වඩා සාර්ථකව ප්‍රදේශගත කිරීම පරිපාලකයන්ට වැඩි බලතල ලබාගැනීමට උපකාරී වනු ඇත. එමෙන්ම වඩා සාර්ථකව පරිපාලනය කිරීම සඳහා මෙම ආයතනයන් දෙක විශාල වැඩිද යන්න පරීක්ෂාකර බැලීම ප්‍රයෝජනවත්වේ.

රබර්

රබර් නිෂ්පාදනය 1977 දී රාත්තල් දශ ලක්ෂ 322 සිට 1978 රාත්තල් දශලක්ෂ 343 දක්වා සියයට 7 කින්වැඩි විය. මෙය රාත්තල් දශලක්ෂ 351 ක උපරිම නිෂ්පාදනයක් 1970 දී ලබා ගැනීමෙන් පසුව වාර්තාගත වූ ඉහළම නිෂ්පාදනයයි. 1978 දී රාත්තල් 753 ක් වූ අක්කරයක සාමාන්‍ය පලදාව සියයට 9 ක පමණ සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කලේය. මෙය මෙතෙක් වාර්තාගතව ඇති ඉහලම පලදාවයි අනෙක් අතට, කිරි කපන අක්කර ප්‍රමාණය සියයට 2 කින් පහල වැටුනි. නිෂ්පාදනයේ කැපී පෙනෙන වැඩි වීම බෙහෙවින්ම සතුටුදායක කාලගුණික තත්ත්වයන් සමඟ වාසි දායක මිලගනන්වලට දක්වනු ලැබූ යහපත් ප්‍රතිචාරයේ ප්‍රතිඵලයකි. වාසිදායක නිෂ්-පාදන ලාභ, ගසට අහිතකර අන්දමින් කිරි කැපීම සඳහා ද සමහර ආන්තික නිෂ්පාදකයින් උනන්දු කරවන්නට ඇත.

නැවත වගා කරන ලද අක්කර ප්‍රමාණය 1977 දී අක්කර 6,465 සිට 1978 දී අක්කර 7,968 දක්වා සියයට 23 කින් සැලකිය යුතු පරිදි වැඩි විය. මෙම වැඩි දියුණු වූ තත්ත්වය තරමක් දුරට 1977 නොවැම්බර් මස දී ප්‍රකාශයට පත්කල නැවත වගා කිරීමේ සහනාධාරය වැඩි කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකිය. නැවත වගා කිරීම තවමත් අවශ්‍ය සම්ප්‍රදායික ඉලක්කය වන වර්ෂයකට අක්කර 15, 000 ට වඩා (මෙතෙක් එක් රැස් වී ඇති ප්‍රමාණයද පියවීමට නම් අක්කර 17, 000 පමණ) බෙහෙවින් අඩු නිසා රජය, සහනාධාරය අක්කරයකටරු. 3,000/= සිට රු. 4, 000/= දක්වා 1978 නොවැම්බර් හි දී තව දුරටත් වැඩි කරනු ලැබීය. කිරි කැපීමට නොහැකි දිගු කාලපරිච්ඡේදය තුල දි අහිමි වන ආදායමත් නැවත වගා කිරීමේ සම්පූර්ණ වියදමත් පියවා ගැනීමට සහනාධාරයේ මෙම වැඩි වීම ප්‍රමාණවත් නොවන බව පෙනෙන්නට ඇති නමුත්, මෙම පියවර 1979 දී නැවත වගා කිරීම කෙරෙහි යහපත් බලපෑමක් ඇති කල හැකිය. 1978 වර්ෂය අවසාන වන විට නැවත වගා කර තිබූ මුළු බිම් ප්‍රමාණය අක්කර 3, 46, 653 හෙවත් වගාව යටතේ ඇති මුළු අක්කර ප්‍රමාණයෙන් සියයට 62 ක් විය.

1978 දී අක්කර 935 ක අලුතෙන් රබර් වගා කරනු ලැබීය. ඊට පෙර වර්ෂයේදී මෙය අක්කර 111 ක් විය. ඉහළ නිෂ්පාදන ලාභ සහ 1978 සඳහා වන අය වැය ලේඛනයෙහි ප්‍රකාශයට පත් කල අලුතින් වගා කිරීමේ සහනාධාරය අක්කරයකට රු. 1, 800 සිට රු 2, 700 දක්වා වැඩි කිරීම ද මෙම වර්ධනයට හේතු විය.

රබර් වගාව සඳහා පොහොර නිකුතුව 1977 දී මෙට්‍රික් ටොන් 12, 440 සිට 1978 දී මෙට්‍රික් ටොන් 21, 010 දක්වා වැඩි විය. පොහොර භාවිතයේ මෙම වැඩි වීම පොහොර පහසුවෙන් ලබාගත හැකි වීමත් 1978 මුල් භාගය තුලදී පෞද්ගලික අංශයේ ගොවියනට දෙනු, ලැබූ ඉහළ සහනාධාර මට්ටමේත් ප්‍රතිඵලයකි.

ස්වාභාවික රබර් වල අනාගතය බෙහෙවින් සතුටුදායක බව පෙනෙන්නට තිබේ. තෙල් මිළ දැඩි ලෙස ඉහළ නැගීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරද්දී ඛනිජ තෙල් රසායනික කර්මාන්තයේ නිෂ්පාදනයක් වන තරඟකාරී කෘත්‍රිම රබර්වල මිළ බෙහෙවින් ඉහළ නැඟීම නිශ්චිතය. එපමණක් ද නොව මූලික නිෂ්පාදකයන් අතර ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා ඇති ඉඩකඩ රබර් සම්බන්ධයෙන් සලකා බලන කල බෙහෙවින්ම සතුටුදායක බව පෙනෙන්නට තිබේ. ඒ නිසා රබර් නිෂ්පාදනය වැඩි කිරීමෙන් වඩා යහපත් මිළ තත්ත්වයෙන් වාසි ලබා ගැනීමට වඩාත් වීරියමත් ප්‍රයත්නයක් අවශ්‍යව ඇත. දැනට පවතින නැවත වගා කිරීමේ අනුපාතය දෙගුණ කිරීම වුවද අධික වේයයි සිතිය නොහැක. ඇත්ත වශයෙන්ම දර සැපයීමෙහිලා වැදගත් වන උදුරන ලද රබර් ගස් ප්‍රමාණය දැනට අඩුවෙමින් පවතින බව පෙනේ. නැවත වගා කිරීමේ ඉලක්කයන් වෙත ළඟා වීමටත්, නැවත වගා කිරීමේ එක් රැස්ව ඇති හිඟයන් පියවීමටත්, සහනාධාරයේ සැලකිය යුතු වැඩි වීමක් අවශ්‍ය වනු ඇත. කුඩා ඉඩම් හිමියන්ට සපයනු ලබන පහසුකම් වැඩි දියුණු කිරීම ද රබර්වල ගුණාත්මක තත්ත්වයන් ඉහළ නැංවීමට උපකාරී වනු ඇත. වඩා හොඳ තත්ත්වයේ රබර් සඳහා ලැබෙන මිළ වාරිකය සැලකිය යුතු ප්‍රමාණයකි.

පොල්

පසුගිය වසර දෙක තුළ නොකඩවා පැවති තද නියඟය හේතුවෙන් 1977 දී ඉතා පහල මට්ටමකට අඩු වූ පොල් නිෂ්පාදනය 1978 දී වර්ධනය වන ලකුණු පෙන්විය. 1978 දී නිෂ්පාදනය සියයට 21 ක වැඩිවීමක් දක්වමින් ගෙඩි දශලක්ෂ 2, 207 දක්වා ඉහළ නැගි බව ඇස්තමේන්තු කරඇත. එහෙත්, නිෂ්පාදනය 1970 දශකයේ මුල් වසරවල සාමාන්‍ය නිෂ්පා-දනය වූගෙඩි දශලක්ෂ 2,500 ට වඩා බෙහෙවින් පහල මට්ටමක පැවතුණි.

පොල් වගා ප්‍රදේශයන්හි 1977 වර්ෂය තුළ මනාව ව්‍යාප්තව පැවති වර්ෂාපතනයේ පසු බලපෑම සහ 1978 වර්ෂයේ දී තවදුරටත් පැවති යහපත් දේශගුණය මෙම වසරේදී පොල් වගාව සැළකිය යුතු ලෙස දියුණු වීමට මූලිකව ඉවහල් විය. පොල් ඉඩම් වඩා හොඳින් පවත්වා ගෙන යාම ද පොල් නිෂ්පාදනය කෙරේ හිතකර බලපෑමක් ඇති කළ බව පෙනී යයි. 1978 දී පොල් ඉඩම්වල පොහොර භාවිතය මෙට්‍රික් ටොන් 42, 500 දක්වා සියයට 46 කින් තියුණු ලෙස වැඩි

විය. වසරේ මුල් භාගය තුළ පෞද්ගලික අංශය සඳහා ක්‍රියාත්මකව පැවති සියයට 75 ක සහනාධාරය ප්‍රධාන වශයෙන් මෙම වැඩිවීමට හේතුවුණි. පොල් අලෙවි මණ්ඩලය මගින් ප්‍රාදේශීය පොහොර බෙදහරින මධ්‍යස්ථාන පිහිටුවීම ද වඩාත් පහසු ලෙස සහ කලට වේලාවට පොහොර ලබාගැනීමට හැකි වීමද පොහොර භාවිතය වැඩිවීමට ඉවහල් විය.

1978 දී නැවත වගා කළ සහ අළුතින් වගා කළ ඉඩම් ප්‍රමාණය පිළිවෙලින් අක්කර 1, 207 සහ 1, 297 කි. අක්කර 233 ක ප්‍රමාණයක් කෝපි, කොකෝවා සහ ගම්මිරිස් සමග මිශ්‍ර වගා වශයෙන් වගා කරනු ලැබිය. පොල් වගා අතුරු-අංශයෙහි නිෂ්පාදනය වැඩි කර ගැනීමට සහ වඩාත් සූක්‍ෂම අයුරින් ඉඩම් ප්‍රයෝජනයට ගැනීම දිරි ගැන්වීම සඳහා ද නැවත වගාව, යටි වගාව, පුනරුත්ථාපනය, අළුත් වගාව සහ මිශ්‍ර වගාව සඳහා සහනාධාර 1978 අගෝස්තු මස දී ඉහළ නංවන ලදී.

1978 නොවැම්බර් මාසයේ පැවති සුළි සුළඟ අම්පාර, මඩකලපුව සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්කයන්හි පොල් ඉඩම් අක්කර 30, 000 ක් පමණ සහමුලින්ම විනාශ කර දමන ලද බව ඇස්තමේන්තු කර ඇත. මෙය දිවයිනේ මුළු පොල් ඉඩම් ප්‍රමාණයෙන් සියයට 2 ක් පමණවේ.

පොල් වගාව සැළකිය යුතු කාලයක් තුළ ඉතාමත් තියුණු ලෙස පාලනය කළ කර්මාන්තයන්ගෙන් එකක් වේ. එක් අතකින්, පොල් දේශීය ආහාරයෙහි වැදගත් ස්ථානයක් හිමි කර ගන්නා අතර සෑම රජයක්ම පාහේ එහි මිළ අඩු මට්ටමක පවත්වාගෙන යාමට යත්න දැරිය. අනෙක් අතින් සළකා බලන කල, ඒකීය බෝගයක් ලෙස පොල් වගාවට අවශ්‍ය වන්නේ සුළු අවධානයකි. (උදාහරණ වශයෙන් තේ හා රබර් සමග සසඳන කල) තමන්ගේ ප්‍රධාන ආදායම වෙනත් මාර්ගයන්ගෙන් ලබා ගන්නා, ඒ නිසාම තම ආයෝජනයට ඉහල සහ ප්‍රමාණවත් ඉපයීමක් ලබාගැනීම පිළිබඳ සැලකිලිමත් නොවන ඉඩමින් බෙහෙවින් බැහැරව වෙසෙන සම්ප්‍රදායික ඉඩම් හිමි කොටසකගේ අතුරු රැකියාවක් බවටපොල් වගාව පත්ව තිබේ අතිරික්ත ධාරිතාවක් ඇතැයි යන පදනම මත, මෑත වකවානුවලදී සැකසුම් කර්මාන්තයෙහි කිසිදු නව ආයෝජනයක් සිදු වී නොමැති තරමය. වෙනත් අයුරකින් දක්වතොත් කර්මාන්තය එම මට්ටමේම පැවතීමේ හෝ පිරිහීමේ ලකුණු පෙන්නුම් කළේය. පාරිභෝජනය ඉහළ ගිය විට හෝ නිෂ්පාදනය පහළ වැටුනු විට, රජයයන් වඩාත් උනන්දු වූයේ පාරිභෝගික මිළ අඩු මට්ටමක පවත්වා ගැනීම උදෙසා අපනයන සීමා කිරීමටය.

නිෂ්පාදකයින්ගේ යහපතට වඩා පාරිභෝගික යහපත තකා ක්‍රියාකලහොත්, පොල් වගාව දිවයිනේ ප්‍රධාන වර්ධන කර්මාන්තය බවට පත්වීමට ඇති ඉඩකඩ ඉතා සුළුය. පොල් වගාව යටතේ ඇති අක්කර ප්‍රමාණය දෙවෙනි වන්නේ වී වගාව යටතේ ඇති අක්කර ප්‍රමාණයට පමණක් බවත්, එනිසා කර්මාන්තය දියුණු කිරීම උදෙසා ගනු ලබන ඕනෑම පියවරක් පාරි-භෝගිකයන් අතර පමණක් නොව නිෂ්පාදකයන් විශාල සංඛ්‍යාවක් අතරත් පුළුල් ප්‍රතිඵල ඇති කරනු ලැබිය හැකි බව සඳහන් කිරීම වැදගත්ය.

නව ආයෝජන මගින් කර්මාන්තයේ ඵලදායිතාව වර්ධනය කළ හැකි වුවද, කර්මාන්තය වඩාත් ලාභදයි තත්ත්වයකට පත්වන තෙක් දිගුකාලින ආයෝජනයක් බලාපොරොත්තු විය නොහැකිය. ආදේශක වශයෙන් යොදගත හැකි තෙල් දේශීයව දියුණු කරන්නේ නම් හෝ ආනයනය කරන්නේ නම්, වැඩි වටිනාකමකින් යුතු පොල් තෙල් ආනයනය ඉහළ නැංවිය හැකිය. වෙනත් අයුරකින් පවසතොත්, පොල් කර්මාන්තය ඉතා අධික වර්ධන හැකි-යාවකින් යුක්ත එකක් වුවද දිගු කලක් තිස්සේ නොසළකා හැරීමෙන් පිරිහීමටකට පත්වී ඇති කර්මාන්තයකි. පොල් කර්මාන්තය සඳහා පිහිටවූ නව අමාත්‍යාංශය මෙම වැදගත් කර්මාන්තයේ පුනරුත්ථාපනය සඳහා අවශ්‍ය පියවර ගැනීමට නියමිතය.

වී

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 1978 වගා වර්ෂයේ (1977/78 මහ සහ 1978 යල) වී නිෂ්පාදනය බුසල් දශ ලක්ෂ 90.6 ක් ලෙස ඇස්තමේන්තු කොට තිබේ. මෙය ඉකුත් වර්ෂයට වඩා බුසල් දශ ලක්ෂ 10.2 ක හෝ සියයට 13 ක වැඩි වීමක් පෙන්නුම් කරයි.

මුළු නිෂ්පාදනයෙන් බුසල් දශ ලක්ෂ 61.6 ක් හෙවත් තුනෙන් දෙකක් පමණ ලබා ගත්තේ මහ කන්නයේදීය. මෙය මෙතෙක් මහ කන්නයකදී වාර්තාගත වූ වැඩිම නිෂ්පාදනය වන අතර ඉකුත් මහ කන්නයට වඩා බුසල් දශලක්ෂ 6.8 ක හෙවත් සියයට 12.4 ක වැඩිවීමක් පෙන්විය. 1978 යල කන්නයේ නිෂ්පාදනය බුසල් දශ ලක්ෂ 28.9 ක් වූ අතර එය මුළු නිෂ්පාදනයෙන් සියයට 32 කි. මෙය ද මෙතෙක් යල කන්නයකදී ලබාගත් වැඩිම නිෂ්පාදනයයි. හිතකර කාල-ගුණික තත්ත්වයන්ට අමතරව, වගා කරන ලද සහ අස්වනු නෙලාගත් භූමි ප්‍රමාණය සැලකිය යුතු අන්දමින් වැඩිවීම, වාරිමාර්ග යටතේ ජලය සැපයූ බිම් ප්‍රමාණය වැඩි වීම, ආයතනික ණය සුලබ වීම, පොහොර භාවිතය වැඩිවීම සහ වී සඳහා සහතික මිළ ඉහල නැංවීම ද 1978 වර්ෂයේ මෙම විශාල අස්වැන්නට හේතු සාධක විය.

වගා කරන ලද බිම් ප්‍රමාණය 1977 දී අක්කර දශ ලක්ෂ 2.05 සිට 1978 දී අක්කර දශ ලක්ෂ 2.16 දක්වා සියයට 6 කින් වැඩි විය. අස්වනු නෙලාගත් බිම් ප්‍රමාණය අක්කර දශලක්ෂ 1·93 සිට 1978 දී දශලක්ෂ 2.07 දක්වා සියයට 7.3කින් වැඩි විය. අස්වනු නෙලූ බිම් ප්‍රමාණය වැඩිවීම, වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ, විශේෂයෙන්ම මහවැලි යෝජනා ක්‍රමයේ පළමුවැනි අදියර යටතේ ජල සම්පාදනයේ ස්ථාවරත්වය වැඩිවීමේ ප්‍රතිඵලයකි. වාරිමාර්ග යටතේ වූ බිම් ප්‍රමාණය ඉකුත් වර්ෂයට වඩා අක්කර 1,21,000 කින් වැඩි විය. වගා කරන ලද සහ අස්වනු නෙලාගත් බිම් ප්‍රමාණය අතර වෙනස මගින් පෙන්නුම් කරන වගා පාලුවේ ප්‍රමාණය 1977 දී සියයට 6 සිට 1978 දී සියයට 4 දක්වා අඩු විය.

කෘෂිකර්ම සංවර්ධන සහ පර්යේෂණ අමාත්‍යාංශයේ ගොවිජන සේවා අංශය මගින් වී වගාව සඳහා නිකුත් කළ පොහොර ප්‍රමාණය 1977 දී ටොන් 80,123 සිට 1978 දී ටොන් 1,12,000 දක්වා සැලකිය යුතු අන්දමින් වැඩි විය. මෙය සියයට 40 ක වැඩි වීමකි. වී වගාව සඳහා කෘෂිකාර්මික ණය 1977 වගා වර්ෂයෙහි වූ රුපියල් දශ ලක්ෂ 99·2 සිට 1978 වගා වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 452·6 දක්වා විශාල වශයෙන් වැඩි විය. මෙම වැඩිවීමෙන් අධික ප්‍රමාණයක් වාර්තා වූයේ වසරේ මහ කන්නයේ දී ය.

ඉහතන් දක්වන ලද හිතකර සාධක මධ්‍යයේදීත් අක්කරයක සාමාන්‍ය පලදාව වැඩි වූයේ ඉතා සුළු ප්‍රමාණයකිනි. අක්කරයක සාමාන්‍ය පලදාව 1978 දී බුසල් 50.7 ක් වූ අතර 1977 දී වාර්තා වූයේ බුසල් 48.9 කි. මෙම සුළු වැඩිවීමට වුවද මුළුමනින්ම හේතු වූයේ වාරිමාර්ග යටතේ ජලය සපයන ලද බිම්වල ඵලදාව වැඩි වීමයි වැසි ජලයෙන් වී වගා කරණ ප්‍රදේශවල ඵලදාව සුළු අඩු වීමක් පෙන්විය. ඉකුත් වාර්ෂික වාර්තාවේ ද සඳහන් කළ පරිදි බෙහෙවින් හිතකර තත්ත්වයන් යටතේ අඩු ඵලදාවක් ලැබීම දැඩි අවධානයට යොමු විය යුතු කරුණකි. ඉඩම් හිඟයක් පවතින රටක ඉඩම් ඒකකයක ඵලදායිතාව උපරිම කිරීම අතිශයින් වැදගත්ය. එම නිසා, අක්කරයකට ලබාගත හැකි ඵලදාව සහ ඇත්ත වශයෙන් ලබන ඵලදාව අතර පරතරය අඩු කිරීමේ සූක්ෂම පිළිවෙළකට කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්තියෙහි වැඩි පූර්විතාවක් දිය යුතුය.

වී අලෙවි මණ්ඩලය 1978 වී නිෂ්පාදනයෙන් බුසල් දශ ලක්ෂ 32 ක් හෙවත් සියයට 35 ක් මිළදී ගත්තේය. මෙය 1971 සිට මෙතෙක් මිළ දී ගෙන ඇති වැඩිම ප්‍රමාණය වූ අතර, 1977 මිළදී ගත් ප්‍රමාණයට වඩා බුසල් දශ ලක්ෂ 7.5 ක් හෙවත් සියයට 32 ක වැඩි වීමක් පෙන්වයි. විශාල අස්වැන්න සහ වී බුසලක සහතික මිළ 1977 නොවැම්බර් මාසයේ දී රුපියල් 33 සිට රුපියල් 40 දක්වා වැඩි කිරීම ද, මිළදී ගැනීමේදී වී වල තත්ත්වය පිළිබඳ මිනුම් ලිහිල් කිරීම ද, වී මිළදී ගැනීම්හි මෙම වැඩිවීමට උපකාරී විය. මිළදී ගැනීම් වලින් සියයට 85 ක් පමණ කරන ලද්දේ වියලි කලාපීය ප්‍රදේශයන්හි, විශේෂයෙන් ම අනුරාධපුර, පොලොන්නරුව සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල ය.

සලාක යටතේ නිකුත් කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය විසින් 1978 දී සහල් ටොන් 2,53,121 ක් ද, (වී බුසල් දශ ලක්ෂ 17.7 ට සමාන ප්‍රමාණයකි) වී බුසල් දශ ලක්ෂ 9.3 ක් ද, (සහල් ටොන් 1,33,000 ට සමාන ප්‍රමාණයක්) ආහාර කොමසාරිස් වෙත භාරදෙනු ලැබීය. වී අලෙවි මණ්ඩලයේ ගබඩා කිරීම් සහ වී කෙටීමේ ධාරිතාව පිළිබඳ ප්‍රශ්න ලිහිල් කර ගැනීමේ බලාපොරොත්තුවෙන් සලාකය යටතේ වී.නිකුත් කිරීම 1978 මැයි මාසයේ අවසාන සතියේ පටන් ආරම්භ කරන ලදී.

වී අලෙවි මණ්ඩලයේ ගබඩා ධාරිතාව 1977 දී වූ බුසල් දශ ලක්ෂ 15.4 සිට 1978 අවසානයේ දී බුසල් දශ ලක්ෂ 16.5 දක්වා වැඩි වුව ද, අතිරික්ත වී නිෂ්පාදන ප්‍රදේශ-වල ගබඩා කිරීම් පහසුකම් ප්‍රමාණවත් නොවීමේ ප්‍රශ්නය .දිගටම පැවතිනි. මිල දී ගැනීම් වලින් වැඩි ප්‍රමාණයක් එනම් බුසල් දශ ලක්ෂ 22 ක් හෙවත් සියයට 66 ක් මාර්තු ජූලි කාලච්ඡේදය ඇතුළත දී සිදුවීම නිසා ගබඩා ප්‍රශ්නය උග්‍ර විය. මෙම තත්ත්වය නිසා වී ටාර්පෝලින් වලින් වසා එළි මහනේ ගබඩා කිරීමට ද, මණ්ඩලයේ කාරක පිරිවැය ඉහළ නංවමින් අතිරික්ත ප්‍රදේශවල සිට හිඟ ප්‍රදේශවලට වී ප්‍රවාහනය කිරීමටද අවශ්‍යතාවක් මතු විය. වී අලෙවි මණ්ඩලයේ ගබඩා පහසුකම් පුළුල් කිරීමේ වැඩ පිළිවෙළ ව්‍යිමත් කිරීම සමඟම, මණ්ඩලය සහ ආහාර කොමසාරිස්වරයා අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් ඇති කිරීම, ගබඩා පහසුකම් හිඟකමෙන් ඇති වන ගබඩා සහ අපතේ යාම් පිළිබඳ ප්‍රශ්නයන් ලිහිල් කර ගැනීමට බෙහෙවින් උපකාරී වනු ඇත.

ආනයන ලිහිල් කිරීම නිසා මෝල්කරුවන්ට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා අමතර කොටස් අවහිරයකින් තොරව ලබාගත හැකිවීම හේතු කොට ගෙන සහල් කෙටීමේ ධාරිතාව, පසුගිය වර්ෂය තුළදී වැඩි දියුණු විය. 1978 පෙබරවාරි මාසයේ සිට ජනගහනයෙන් අඩක පමණ සහල් සලාකය ඉවත් කිරීම, පෞද්ගලික සහල් වෙළඳපලෙහි හදිසි පුළුල් වීමකට හේතු විය. සහල් කෙටීමේ ධාරිතාවේ වැඩි දියුණුවීම ඉල්ලුමේ මෙම අධික පුළුල්වීම සපුරාලීමට පෞද්ගලික අංශයට හැකියාවක් ලබා දුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළ දී සහල් සඳහා විවෘත වෙළඳපල මිළ සාමාන්‍යයෙන් ස්ථාවර මට්ටමක පැවතුනි.

### පොහොර

පොහොර සංස්ථාවට අනුව, මුළු පොහොර නිකුතුව ඉකුත් වසරෙහි මට්ටම වූ මෙට්‍රික් ටොන් 3,03,500 සිට මෙට්‍රික් ටොන් 3,72,300ක ඉහළ මට්ටමක් දක්වා සියයට 23 කින් වැඩි විය. මෙම සැලකිය යුතු වැඩි වීම, පොහොර කල්වේලා ඇතුව ලබාගත හැකිවීම සහ සාමාන්‍ය-යෙන් කෘෂිකර්මයට හිතකර තත්ත්වයන් නිසා ඉල්ලුම වැඩිවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. තවද, පෞද්ගලික අංශයේ ගොවීන්, සඳහා සහනාධාරය, 1978 ප්‍රථම භාගයේ දී පැවති සියයට 50 සිට සියයට 75 දක්වා වැඩි කිරීම ද පොහොර නිකුතුවේ මෙම වැඩිවීමට හේතු විය. පොහොර නිකුතුවෙන් සියයට 31 ක් පමණ තේ වගා අංශය සඳහා වූ අතර පොල් සහ රබර් වගා අංශ සඳහා ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 11 ක් සහ සියයට 6 ක් විය. වී වගා අංශයට සියයට 35 ක් නිකුත් කරනු ලැබීය.

පොහොර සංස්ථාවේ විකුණුම් මිලයන් මත පදනම් වූ පොහොර සහනාධාර අනුපාතිකය වර්ෂය තුළ දී කිහිප වරක්ම වෙනස් කරනු ලැබීය. 1978 මාර්තු 15 වෙනිද සිට බලපාන පරිදි රාජ්‍ය අංශයට දෙන ලද සහනාධාරය සියයට 75 සිට 50 දක්වා අඩුකරනු ලැබීය. පෞද්ගලික අංශය සඳහා සහනාධාරය සියයට 75 මට්ටමේම දිගටම පැවතින. 1978 ජූලි පළමුවැනිද සිට ක්‍රියාත්මක වන පරිදි මෙම අනුපාතිකයන් රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය සඳහා පිළිවෙලින් සියයට 25 සහ සියයට 50 දක්වා යලිත් වෙනස් කරනු ලැබිය. මේ අනුව සැකසුන නව ඉහළ මිල ගණන් පුළුල් වශයෙන් පොහොර භාවිතා කිරීම අධෛර්‍යමත් කරවන සුළු විය. පොහොර ආනයනය පිළිබඳ පොහොර සංස්ථාවේ ඒකාධිකාරය අහෝසි කිරීමට රජය තීරණය කළමුත්, පොහොර සහනාධාර මිල ගණන් සංස්ථාවේ විකුණුම් මිල ගණන් වලට අනුකූලව තීරණය කරන තාක් මෙය ක්‍රියාත්මක කළ නොහැකි විය. එමනිසා 1978 නොවැම්බර් 21 වැනි දින ආනයන (මි. ගැ.) මිලෙන් සියයට 50 ක ඒකීය සහනාධාරයක් හඳුන්වා දෙන ලදී. ඒ සමගම පොහොර සඳහා වූ සියයට 12½ ක තීරු ගාස්තුව සහ ව්‍යාපාර පිරිවැටුම් බද්දද ඉවත් කරනු ලැබිය. මෙම පියවර සමග පොහොර මිල සියයට 5 සිට 10 දක්වා ප්‍රමාණයකින් අඩු වුවද එම මිල වර්ෂය ආරම්භයේ දී තිබුණු මිලට වඩා ඉහළ මට්ටමක විය.

### ධීවර සහ පශු නිෂ්පාදනය

ඉකුත් වසරෙහිදී වූ සුළු දියුණුවට වෙනස්ව 1978 වසරේදී මාළු නිෂ්පාදනය 1977 දි වූ ටොන් 1,38, 221 සිට ටොන් 1,60,125 දක්වා සියයට 16 කින් වැඩිවී ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. පෞද්ගලික අංශයේ මාළු නිෂ්පාදනය ටොන් 22,000 කින් හෙවත් සියයට 16 කින් වැඩිදියුණු වීම මෙම ප්‍රගතියට හේතු විය. රාජ්‍ය අංශයේ නිෂ්පාදනය ස්ථාවර මට්ටමක පැවති අතර මුළු නිෂ්පාදනයෙන් රාජ්‍ය අංශයේ ප්‍රතිශතය සියයට 1 ට වඩා අඩු ප්‍රමාණයක දිගටම පැවතුනි.

වර්ෂය තුල දී ධීවර සංස්ථාවේ ප්‍රතිපත්තිය පෞද්ගලික අංශයෙන් වැඩිපුර මාළු මිල දී ගැනීම කෙරෙහි යොමු විය. ඒ අනුව සංස්ථාව පෞද්ගලික අංශයෙන් මාළු ටොන් 4,203 ක් මිල දී ගත් අතර එය ඉකුත් වර්ෂයට වඩා සියයට 74 ක වැඩිවීමකි. මිලදී ගැනීමෙහි මෙම වැඩිවීම, පෞද්ගලික අංශයෙහි නිෂ්පාදනය වැඩිවීමද පිළිබිඹු කළේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව 1978 කිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්ෂ 212 ක් යයි ගණන් බලා ඇත. මෙය 1977 නිෂ්පාදන මට්ටම වූ ලීටර් දශ ලක්ෂ 214 සිට පහත වැටීමක් පිලිබිඹු කරයි. ජාතික කිරි මණ්ඩලයට එකතු කිරීමට හැකි වූයේ ලීටර් දශ ලක්ෂ 49 ක් හෙවත් වර්ෂයේ මුලු නිපැයුම්වලින් සියයට 23 ක් පමණකි. ඉකුත් වර්ෂයේදී මණ්ඩලය කිරි ලීටර් දශ ලක්ෂ 55ක් හෙවත් සියයට 25 ක් එකතු කළේය. නිෂ්පාදනයෙහි මෙන්ම එකතු කිරීමේ පහත වැටීම ද ප්‍රධාන වශයෙන්ම සත්වාහාර වල අධික මිල නිසා නිෂ්පාදක ආන්තිකයන් පහළ මට්ටමක පැවතීම තුලින් පැහැදිලි කළ හැකිය. ඇතැම් විට, ගව ලේස් මිල අධික වීම නිසා සතුන් වැඩිපුර ඝාතනය කිරීමද කිරි නිෂ්පාදනය කෙරෙහි ද හිතකර බලපෑමක් කරන්නට ඇත. තෙල් සහ මේද සංස්ථාව විසින් සත්වාහාර මිල සියයට 20 කින් පමණ අඩු කිරීම ද, කිරි මණ්ඩලය විසින් 1978 නොවැම්බර් මාසයේ දී කිරි මිල දී ගැනීමේ මිල සියයට 38 කින් පමණ වැඩි කිරීමද නිසා 1978 මෙම පහත වැටීමේ ප්‍රවණතාව 1979 දී ආපසු හැරීමට ඉඩ ඇත.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව විසින් ගණන් බලා ඇති පරිදි බිත්තර නිෂ්පාදනය 1977 දී වූ බිත්තර දශ ලක්ෂ 380 සිට 1978 දී දශ ලක්ෂ 360 දක්වා සියයට 5 කින් පහත වැටී ඇත. පසුගිය වසරේ මෙන්ම, ප්‍රධාන වශයෙන් අධික සත්වාහාර මිල නිසා නිෂ්පාදකයාගේ ලාභ පහල මට්ටමක වීම නිෂ්පාදනයෙහි මෙම අඩුවීමට හේතු විය.

## කර්මාන්ත

ශ්‍රී ලංකාවේ කාර්මික නිෂ්පාදන වටිනාකම (ප්‍රධාන සම්ප්‍රදායික කෘෂි අපනයන වන, තේ, රබර් සහ පොල් ආශ්‍රිත අපනයන සැකසුම් කර්මාන්ත හැර)1977 දී රුපියල් දශලක්ෂ 7004 සිට 1978 දී රුපියල් දශලක්ෂ 8851 දක්වා වැඩිවූ බවට ඇස්තමේන්තු කර ඇත. මෙය ගතවූ වර්ෂයේ පෙන්නුම් කළ සියයට 16 ක වැඩිවීම හා සැසඳූ කල සියයට 26 ක වැඩිවීමක් පිළිබිඹු කරයි.[1] මිල මට්ටමෙහි වෙනස්වීම් මකාලනු වස්, තොග අලෙවි මිල දර්ශකයෙන් ගැළපූ කල 1978 මූර්ත කාර්මික වර්ධන අනුපාතිකය සියයට 11 ක්වූ බවට ඇස්තමේන්තු කළ හැකිය. 1977 හා 1976 යන වර්ෂ දෙකේදීම සියයට එකක් බැගින් වූ වර්ධන අනුපාතික සමග මෙය සැසඳේ.

1977 ආර්ථික ප්‍රතිපත්ති නව මඟකට යොමුවීමෙන් පසුව පාලන විලංගුවලින් මුදහැරි දේශීය කර්මාන්ත ඊට නිතැතින්ම දක්වූ ප්‍රතිචාරයක් ලෙස 1978 දී කැපී පෙනන හා පෙරනොවූ විරූ අන්දමින් කර්මාන්ත අංශයේ සිදුවූ මෙම ක්ෂණික ප්‍රගතිය විස්තරකළ හැකිය. ආනයන ලිහිල් කිරීම නිසා අමු ද්‍රව්‍ය සහ අමතර කොටස් පහසුවෙන් ලබාගත හැකිවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තොග රැස්කිරීම අඩුකිරීමටත්, ධාරිතා උපයෝගීකරණය වැඩි කිරීමටත් පුළුවන් විය. සීමිත ආනයන තරඟය නිසා තරඟකාරී පරිසරයක භාණ්ඩ තත්ත්වය උසස් කිරීම අවශ්‍ය විය. සැලහන ආනයන ආරක්ෂණයක් යටතේ වුවද,තරඟ කිරීමට නොහැකි තරම් අකාර්යක්ෂමවූ ඇතැම් කර්මාන්ත කොන්වූ බවක් පෙනුනද, එබඳු කර්මාන්ත අධික සමාජ-ආර්ථික වියදමක් යටතේ සදාකාලයටම ආරක්ෂා කළයුතුද යන්න විමසා බැලිම වටී. වැඩියෙන් රැකියා සැපයීම අරමුණු කොටගත් අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්ත තත්ත්වයෙන් හා තරඟකාරීත්වයෙන් උසස් රෙදිපිළි ආනයන කෙරෙන් එල්ල වූ තීරණාත්මක අභියෝගයට මුහුණ දුන් නමුත්, මෙය ප්‍රධාන වශයෙන්ම උද්ගතවූයේ ආරක්ෂණ තිරුබදු පරිපාලනමය වශයෙන් ඉවතලා දේශීය වෙළෙඳ පලට හොඳ රෙදිපිළි ලාභයට සැපයීමටගත් තීරණයක ප්‍රතිඵලයක් වශයෙනි. පාරිභෝගිකයා පිට බර පටවමින් අත් යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ රැකීරක්ෂා සැපයීමට දිගටම සහනාධාර දීම දීර්ඝ කාලීන වශයෙන් අකාර්යක්ෂමතාව ඇති කරමින් නිෂ්පාදන ඵලදාව අඩුකර ලන්නක් බව පෙනේ. ජාත්‍යන්තර වෙළඳ පලට නිපදවීම් සඳහා ශිල්ප ක්‍රම සහ තත්ත්වය උසස් කිරීම ඊට වඩා යෝග්‍ය විය හැකිය.

---

1. ගතවූ වර්ෂ වල මෙන් මෙම දත්තයනට පදනම වූයේ දේශීය කර්මාන්ත වලින් ප්‍රධාන කොටස ලෙස ගැනෙන කර්මාන්ත ආයතන 1500 ක් පමණ අරභයා මහ බැංකුව විසින් කරනු ලබන සමීක්ෂණයයි. විස්තර ලබඳී නිකුත්වන ආර්ථික විවරණයෙහි දක්වෙනු ඇත.